ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2015/06/30 |

## 2015 ජූනි මස උද්ධමනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ (කො.පා.මි.ද.) (2006/07=100) විචලනය මගින් මනිනු ලබන උද්ධමනය ලක්ෂ්‍යමය පදනම මත මැයි මාසයේ වාර්තා කළ සියයට 0.2 හි සිට ජූනි මාසයේ දී සියයට 0.1 දක්වා ආන්තික වශයෙන් පහළ ගියේය. වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2015 මැයි මස පැවැති සියයට 1.9 හි සිට 2015 ජූනි මාසයේ දී සියයට 1.7 දක්වා පහළ වැටිණි. කෙසේ වුවද, කො.පා.මි.දර්ශකය 2015 මැයි මාසයේ සිට ජූනි මාසය දක්වා සියයට 1.0 කින් ඉහළ ගියේය.



කො.පා.මි. දර්ශකයේ මෙම මාසික ඉහළ යෑම කෙරෙහි ආහාර ද්‍රව්‍යවල මිල ගණන් ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. සමහර එළවළු වර්ග, මත්ස්‍ය වර්ග, අමු මිරිස්, රතු ළූනු, දෙහි, පරිප්පු, අර්තාපල් සහ හාල්මැස්සන් ආදියෙහි මිල ගණන් 2015 ජුනි මාසයේ දී ඉහළ ගියේය. කෙසේ වුවද, බොහෝ පළතුරු වර්ග, පොල්, පොල්තෙල්, ලොකු ළූනු සහ මුංඇට ආදියෙහි මිල ගණන් මෙම මාසය තුළ  පහළ ගියේය.

ආහාර නොවන කාණ්ඩයේ රෙදිපිළි හා පාවහන්; ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු; සහ විනෝදාත්මක හා සංස්කෘතික යන උප කාණ්ඩවල මිල ගණන් මෙම මාසය තුළ ඉහළ ගිය අතර නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන; සෞඛ්‍ය; ප්‍රවාහන; අධ්‍යාපන; සන්නිවේදන සහ  විවිධ භාණ්ඩ හා සේවා යන උප කාණ්ඩවල මිල ගණන් මෙම මාසය තුළ නොවෙනස්ව පැවතිණි.

ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය පිළිබිඹු කරන මූලික උද්ධමනය ලක්ෂ්‍යාමය පදනම මත 2015 මැයි මස පැවති සියයට 2.6 හි සිට 2015 ජුනි මාසයේ දී සියයට 2.8 දක්වා ඉහළ ගියේය. වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2015 මැයි මස පැවති 2.9 හි  සිට 2015 ජුනි මාසයේ දී සියයට 2.8 දක්වා ආන්තික වශයෙන් පහළ ගියේය.